දුරකථන / தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister – 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary – 2784812

කාර්යාලය / அலுவலகம் / Office – 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව


මගේ අංකය / எமது இல. / My No. – ED/01/12/01/01

ඔබේ අංකය / உமது இல. / Your No. – ..............................

දිනය / திகதி / Date – 2013.03. 13 –

චක්‍රලේඛ අංක :-2013/11

සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

## පාසල්වල විවිධ අවස්ථාවල දී මුදල් එකතුකිරීම.

2013.02.07 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය නොමැති කාර්යයන් සඳහා අරමුදල් රැස්කිරීමේ කටයුතුවලින් වළකින ලෙස, ජාතික හා පළාත් අධ්‍යාපන බලධාරීන් වෙත, නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන ලෙස, අධ්‍යාපන අමාත්‍යවරයා වෙත කර ඇති නියෝග මත, මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

පාසල්වල දෙමව්පිය පන්ති භාව, දෙමව්පිය සංගම් හා ආදි ශිෂ්‍ය සංගම් මඟින් විවිධ ව්‍යාපෘති සඳහා නීති විරෝධී ව මුදල් එකතු කිරීම සපුරා තහනම් වේ.

එසේ ම 1975 අංක 57/75 දරන පහසුකම් හා සේවා ගාස්තු චක්‍රලේඛය, 1982.03.30 දිනැති අංක 82/2 දරන පාසල් සංවර්ධන සමිති චක්‍රලේඛය, 2008.11.03 දිනැති ආදි ශිෂ්‍ය සංගම් හා වෙනත් සංගම්වල ක්‍රියාකාරකම්වලට අදාළ ව නිකුත් කර ඇති 2008/41 දරන චක්‍රලේඛය, පාසල් නගා සිටුවීමේ වැඩසටහනට අදාළ ව නිකුත් කර ඇති 2008.09.15 දිනැති අංක 2008/35 දරන චක්‍රලේඛය, පාසල්වල උසස් පෙළ පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමට අදාළ ව නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරන චක්‍රලේඛය හා පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ ව නිකුත් කර ඇති 2012.05.29 දිනැති අංක 2012/19 දරන චක්‍රලේඛයන්හි දක්වා ඇති නීත්‍යානුකූල ගාස්තු පමණක් අය කිරීමට කටයුතු කළ යුතු ය.එහි දී පහත සඳහන් අවස්ථා පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කර ක්‍රියා කළ යුතු ය.

I. මෙම නීත්‍යානුකූල ගාස්තු ගෙවීමට වුවද දෙමව්පියන්ට හා සිසුන්ට අනිවාර්ය කිරීමක් හෝ බල කිරීමක් නොකළ යුතු වේ.

II. නීත්‍යානුකූල ගාස්තු වුවද ගෙවීමට අපහසු සිසුන්, ග්‍රාම නිලධාරී සහතිකය මඟින් ඒ බව තහවුරු කළ විට, සියලු ගෙවීම්වලින් එම ශිෂ්‍යයා නිදහස් කළ යුතු අතර එසේ ගාස්තු ගෙවීමෙන් නිදහස් කළ බවට අදාළ දෙමව්පියන් වෙත ලිඛිතව දන්වා යැවිය යුතු ය.

III. ගාස්තු නොගෙවන සිසුන් කිසියම් ආකාරයක හෝ කායික, මානසික පීඩාවන්ට ලක් නොකළ යුතු ය.

එසේ ම සෘජු ව හෝ වක්‍ර ව අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ උල්ලංඝනය කර මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

ඉහත උපදෙස් නොසලකා නීති විරෝධීව කටයුතු කරනු ලබන විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා පාසල් පද්ධතිය තුළ සේවයේ නිරත වන සෙසු කාර්යය මණ්ඩල සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව දැඩි විනයානුකූල පියවර ගනු ලැබේ.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්-

1. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
2. පළාත් අධ්‍යාපන ලේකම් - කරු.දැ.ගැ.ස.
3. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු.අ.කා.ස.
4. ගණකාධිකාරී,අභ්‍යන්තර විගණක - කරු.අ.කා.ස.